**මධ්‍යම පළාත් කලා උළෙල - 2024**

**<u>සාහිත්‍ය නිර්මාණ තරගාවලිය</u>**

**පාසල්, දහම් පාසල් අංශය**

මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන මධ්‍යම පළාත් කලා උළෙල විවිධාංග රුසක් සමගින් 2024 ඔක්තෝම්බර් මාසයේදී පැවැත්වීමට තීරණය කර ඇත.

එම කලා උළෙල නිමිති කොටගෙන පාසල්, දහම් පාසල් අංශය සඳහා සාහිත්‍ය නිර්මාණ තරගාවලියක් පහත අංග ඇතුලත්ව ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා මධ්‍යම පළාතම ආවරණය වන පරිදි පාසල් සහ දහම් පාසල්වල ඉගෙනුම ලබන සිසු සිසුවියන්ට සහභාගීවීමට අවස්ථාව සලසා ඇත. එම නිර්මාණ තරග කලා උළෙල පැවැත්වීමට පෙර අවසන් කළ යුතුව ඇත.. එබැවින් ඔබගේ කොට්ඨාසයේ පාසල් හා දහම් පාසල් සම්බන්ධ කර ගනිමින් ප්‍රාදේශීය මට්ටමින් නිර්මාණ තරගාවලිය පවත්වා එක් එක් තරග අංශයෙන් ප්‍රථම ස්ථානය ලබා ගත් නිර්මාණය අයදුම්පත්‍රය සමඟ පළාත් තරගය සඳහා යොමු කිරීමට කටයුතු කළ යුතු වේ. ජයග්‍රාහී නිර්මාණ යොමු කිරීමේදී ලිපි කවරයේ වම්පස ඉහළ **"මධ්‍යම පළාත් කලා උළෙල 2024"** ලෙස සඳහන් කළ යුතු වන අතර සියලුම නිර්මාණ **පළාත් අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය, මහනුවර** යන ලිපිනයට 2024 -06 -15 වන දිනට පෙර එවිය යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

1.. පාසැල් සහ දහම් පාසැල් අංශයේ තරගකරුවන්ට තරග දෙකක් සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ඇති අතර එක් තරගයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි. එසේම එක් තරගකරුවෙක් තරග දෙකක් සඳහා ඉදිරිපත් වන්නේනම් අදාල නිර්මාණ සමග වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතු වේ.

2.. පාසල් සහ දහම් පාසල් අංශයේ තරගකරුවන් සඳහා එම අංශයෙන් පමණක් ඉදිරිපත් විය හැකි අතර පාසල් අයදුම්කරුවන් විවෘත අංශයෙන් අයදුම් නොකිරීමට වගබලා ගත යුතුවේ.

3. නිර්මාණ ඉදිරිපත් කිරීමේදී කිසියම් පුද්ගලයෙකු ජාතියක්, ආගමක් හෝ දේශපාලන පක්ෂයක් විවේචනය නොවන අයුරින් ඉදිරිපත් කිරීමට වග බලා ගත යුතුය.

4. නිර්මාණ ඉදිරිපත් කිරීමේදී අයදුම්කරුගේ තොරතුරු අයදුම්පතේ පමණක් සඳහන් කළ යුතු අතර නිර්මාණයේ කිසිවක් සඳහන් කළ යුතු නොවේ. නිර්මාණකරුගේ තොරතුරු සඳහන් කර ඉදිරිපත් කරන නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. නිර්මාණ ගොනු කිරීමේ පහසුව සඳහා ඔබ ඉදිරිපත් කරන කඩදාසියේ වම් පසින් අඟලක ප්‍රමාණයක තීරුවක් ඉතිරි කළ යුතුයි.

6. පාසල් හා දහම් පාසල් සිසු සිසුවියන්ගේ නිර්මාණ අදාල පාසලේ/ දහම් පාසලේ විදුහල්පති හෝ ප්‍රධානාචාර්ය විසින් සහතික කළ යුතු අතර එම නිර්මාණය කිසියම් ආකාරයකින් ස්වතන්ත්‍ර නිර්මාණයක් නොවන බවට ඔප්පු වුවහොත් ජයග්‍රහණය අවලංගු කිරීමට සිදුවන බවත් යම් හෙයකින් එම නිර්මාණ අයිතිය ප්‍රකාශ කරමින් නීතිමය වශයෙන් හෝ වෙනත් කුමන ආකාරයකින් යමෙකු ඉදිරිපත් වුවහොත් පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් හා විනිශ්චය මණ්ඩලය එම වගකීමෙන් නිදහස් වන බවත් අවධාරණය කෙරේ.

7. ජයග්‍රාහී තරගකරුවන් 2024 ඔක්තොම්බර් මස පැවැත්වීමට නියමිත කලා උළෙලේදී සහතික හා ත්‍යාග පිරිනමමින් ඇගයීමට ලක් කෙරේ. **එතෙක් තරග ප්‍රතිඵල නිකුත් කරනු නොලැබේ.** එසේම තරගය සඳහා යොමු කරණ නිර්මාණ නැවත ලබා දෙනු නොලැබේ.

08.. නිර්මාණ ලබා ගන්නා අවසාන දිනය 2024-06-15 වන අතර තරග පැවත්වීම සම්බන්ධව අවසන් තීරණය පළාත් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් ගනු ඇත.

**ජයග්‍රාහකයින් ඇගයීම පහත සඳහන් පරිදි වේ.**

| අනු අංකය | තරග අංශය | ස්ථානය |
|---|---|---|
| 01. | පද්‍ය රචනා තරගය කනිෂ්ඨ අංශය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය |
| 02. | පද්‍ය රචනා තරගය ජ්‍යෙෂ්ඨ අංශය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය |
| 03. | ගද්‍ය රචනා තරගය කනිෂ්ඨ අංශය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය |
| 04. | ගද්‍ය රචනා තරගය ජ්‍යෙෂ්ඨ අංශය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය |
| 05 | පාසල් කෙටි කතා තරගය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්තානය<br>4.කුසලතා ස්ථාන-02 |

**තරග තකාන්දේසි**

**1.i .ගද්‍ය රචයනා තරගය ( කනිෂ්ඨ අංශය ) :-**

මෙම තරගය සඳහා 6 - 10 ශ්‍රේණිවල ඉගෙනුම ලබන දරුවන්ට සහභාගි වීමට අවස්ථාව ඇත. **"ජැක්සන් ඇන්තනි කලාකරුවා විසින් ඉටු කළ සාහිත්‍ය මෙහෙවර "** යන මාතෘකාව යටතේ තනි පිටුවේ පරිඝණකගත කොට හෝ පැහැදිලි අත් අකුරින් ලියන ලද වචන 750 ට නොවැඩි රචනාවක් විය යුතුය.

ii. **.ගද්‍ය රචනා තරගය ( ජ්‍යෙෂ්ඨ අංශය )**

මෙම තරග අංශ යටතේ 11, 12, 13 ශ්‍රේණිවල දරුවන්ට සහභාගිවීමට අවස්ථාව ඇත. " **ජැක්සන් ඇන්තනි කලාකරුවානන් සාහිත්‍ය හා කලාව වෙනුවෙන් ඉටු කළ මෙහෙවර** " යන මාතෘකාව යටතේ තනි පිටුවේ පරිගණකගත කොට හෝ අත් අකුරින් ලියන ලද වචන 1500 ට නොවැඩි රචනාවක් විය යුතුය.

2. i. **පද්‍ය රචනා තරගය ( කනිෂ්ඨ අංශය )**

මෙම තරගයට 6 -10 ශ්‍රේණිවල දරුවන්ට සහභාගි වීමට අවස්ථාව ඇත. ඉදිරිපත් කරනු ලබන පද්‍ය රචනාව

- **i.** සඳැස් පද්‍ය නම් පද්‍ය 6 කට සීමා විය යුතුය.
- **ii .** නිසඳැස් පද්‍ය/නිදහස් පද්‍ය නම් එම පද්‍ය පෙළ එක් පිටුවකට සීමා විය යුතුය.

**2 ii. පද්‍ය රචනා තරගය ( ජ්‍යෙෂ්ඨ අංශය )**

මෙම තරග අංශය යටතේ 11, 12, 13 ශ්‍රේණිවල දරුවන්ට සහභාගිවීමට අවස්ථාව ඇත.

- **i.** සඳැස් කවි නම් පද්‍ය 8 කට සීමා විය යුතුය.
- **ii .** නිසඳැස් පද්‍ය/නිදහස් පද්‍ය නම් එම පද්‍ය පෙළ එක් පිටුවකට සීමා විය යුතුය.

**3. කෙටි කථා තරගය**

මෙම තරගයට ඉදිරිපත් විය හැක්කේ ජ්‍යෙෂ්ඨ අංශයේ සිසු දරුවන්ට පමණි. කැමති තේමාවක් යටතේ කෙටි කතාව නිර්මාණය කළ හැකිය. පරිගණකගත කර A -4 ප්‍රමාණයේ කඩදාසි 8 කට නොවැඩි විය යුතුය. අත් අකුරින් ලියා ඉදිරිපත් කරන්නේ, නම් තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද A-4 ප්‍රමාණයේ පිටු 15 ක් නොඉක්ම විය යුතුය.

නිර්මාණ ඉදිරිපත් කිරීමේදී තරගකරු ඉදිරිපත් කරන සෑම නිර්මාණයක් සඳහාම සහතික කරන ලද අයදුම්පත්‍රය සමග නිර්මාණයේ එක් පිටපතක් පමණක් අයදුම්පත්‍රය සමඟ අදාළ දිනට පෙර **පළාත් අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය, මහනුවර** යන ලිපිනයට 2024-06-15වන දිනට පෙර තැපැල මගින් එවිය හැකි අතර අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංස්කෘතික නිලධාරි වෙත භාර දීම හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත අතින් ගෙනවිත් භාර දීමට හැකිය. තවද මෙම තරග පිළිබඳ තොරතුරු www.culture.cp.gov.lk යන මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් ද ලබාගත හැකි බව කාරුණිකව සලකන්න

විමසීම් : 081-2238476


ටී.එම්. ඉනෝදනී තඹවිට
පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
යටිනුවර වීදිය,
මහනුවර

**<u>මධ්‍යම පළාත් කලා උළෙල - 2024</u>**
**<u>පාසල් හා දහම් පාසල් සාහිත්‍ය තරගය සඳහා අයදුම් පත්‍රය</u>**

(1). සම්පූර්ණ නම :- ..............................................................................................

..............................................................................................

(2). මුලකුරු සමග නම :- ..............................................................................................

..............................................................................................

(3). පාසලේ / දහම් පාසලේ නම හා ලිපිනය :- ..............................................................................................

..............................................................................................

(4). පෞද්ගලික ලිපිනය :- ..............................................................................................

(5). ස්ථාවර දුරකථන අංක :- ........................................ ජංගම දුරකථන අංකය........................................

(6) Email ලිපිනය :- ..............................................................................................

(7). ස්ත්‍රී පුරුෂ භාවය :- ..............................................................................................

(8). උපන් දිනය :- . ..............................................................................................

(9). පාසල හෝ දහම් පාසල අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ..............................................................................................

(10). දිස්ත්‍රික්කය :- ..............................................................................................

(11). නිර්මාණය ඉදිරිපත් කරනු ලබන අංශය :-..............................................................................................

(12) ඉදිරිපත් කරන නිර්මාණයේ නම :- ..............................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත් ඉදිරිපත් කරන නිර්මාණය මගේම නිර්මාණයක් බවටත් සහතික කරන අතර තරගයේ සියලුම කොන්දේසිවලට හා නීති-රීතිවලට එකඟව කටයුතු කරන බවටත් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගන්නා බවටත් මෙයින් සහතික කරමි.

........................................ ........................................

දිනය අයදුම්කරුගේ අත්සන

ඉහත නම් සඳහන් ශිෂ්‍යයා/ශිෂ්‍යාව ..............................................................................................

විදුහලේ ........................ වන ශ්‍රේණියේ අධ්‍යාපනය හදාරණ බවත් ඉහත නිර්මාණය ශිෂ්‍යයාගේ /ශිෂ්‍යාවගේ නිර්මාණයක් බවට සහතික කරමි.

........................................ ........................................

දිනය පාසලේ/දහම් පාසලේ විදුහල්පතිගේ අත්සන හා නිලමුද්‍රාව

**ජයග්‍රාහකයින් ඇගයීම පහත සඳහන් පරිදි වේ.**

| අනු අංකය | තරග අංශය | ස්ථානය | ත්‍යාග මුදල |
|---|---|---|---|
| 01. | පද්‍ය රචනා තරගය කනිෂ්ඨ අංශය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය | රු. 2 500.00<br>රු 2 000.00<br>රු 1 500.00 |
| 02. | පද්‍ය රචනා තරගය ජ්‍යෙෂ්ඨ අංශය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය | රු. 2 500.00<br>රු 2 000.00<br>රු 1 500.00 |
| 03. | ගද්‍ය රචනා තරගය කනිෂ්ඨ අංශය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය | රු. 2 500.00<br>රු 2. 000.00<br>රු 1 500.00 |
| 04. | ගද්‍ය රචනා තරගය ජ්‍යෙෂ්ඨ අංශය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්ථානය | රු. 2 500.00<br>රු 2. 000.00<br>රු 1 500.00 |
| 05 | පාසල් කෙටි කතා තරගය | 1. ප්‍රථම ස්ථානය<br>2. දෙවන ස්ථානය<br>3. තෙවන ස්තානය<br>4.කුසලතා ස්ථාන-02 (2000.00)බැගින් | රු. 5 000.00<br>රු 4 000.00<br>රු 3 000.00<br>රු. 4 000.00 |